25

අභ්‍යන්තර චක්‍රලේඛ අංක : **05/2021**

මගේ අංකය : PMO/ADM/01/01/02/01

දිනය : 2021 ඔක්තෝබර් මස 07 දින

**අග්‍රාමාත්‍ය කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරින්,**
**අංශ ප්‍රධානීන් හා අනෙකුත් සියලුම නිලධාරින් වෙත**

**<u>මාර්ගගත රැස්වීම්/ සාකච්ඡා සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් සැපයීම</u>**

පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ රාජකාරීමය අවශ්‍යතාවයන් සඳහා පවත්වනු ලබන භෞතික රැස්වීම් වෙනුවට එම රැස්වීම් මාර්ගගත ක්‍රමයට පැවැත්වීම සඳහා අවශ්‍ය Zoom තාක්ෂණික පහසුකම කාර්යාලය මගින් ලබා දීමට තීරණය කර ඇත.

02. මෙම තාක්ෂණික පහසුකම අග්‍රාමාත්‍ය කාර්යාලය සතු zoom@pmoffice.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත ලබාගෙන ඇති අතර රාජකාරීමය අවශ්‍යතාවයන් වෙනුවෙන් ඉහත පහසුකම ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් අදාළ ඉල්ලීම රැස්වීම/ සාකච්ඡාව සඳහා සහභාගීවන්නන්ගේ නාම ලේඛනයක් සහිතව අංශ ප්‍රධානීන් විසින් අතිරේක ලේකම් (පාලන) වෙත ඉදිරිපත් කළ යුතු වේ. එමෙන්ම රාජකාරීමය අවශ්‍යතා මත පවත්වනු ලබන රැස්වීම්/ සාකච්ඡා යනාදිය සඳහා පහත මූලික සීමාවන් සහිතව Zoom තාක්ෂණ පහසුකම ලබාගැනීමේ හැකියාව පවතී.

- එක් රැස්වීමක් සඳහා සහභාගී වියහැකි උපරිම ගණන - 100
- එක් රැස්වීමක උපරිම කාල සීමාව - පැය 30

03. මෙම තාක්ෂණය ඔස්සේ වරකට එක් රැස්වීමක්/ සාකච්ඡාවක් පමණක් පැවැත්විය හැකි බැවින් එක්වර ඉදිරිපත් වන ඉල්ලීම් සලකා බලා ප්‍රමුඛතාවය අනුව එම පහසුකම ලබාදීම අතිරේක ලේකම් (පාලන) විසින් තීරණය කරනු ලැබේ.

04. ඔබගේ රැස්වීම/ සාකච්ඡාව සඳහා අතිරේක ලේකම් (පාලන) විසින් අනුමැතිය ලබාදීමෙන් අනතුරුව ඊට අවශ්‍ය තාක්ෂණික පහසුකම ලබා ගැනීම හා අවශ්‍ය වැඩිදුර උපදෙස් හා තාක්ෂණික සහය නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) වෙතින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

**ගාමිණී එස්. සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්